Prepared by – M.B.I.G. Kumari
R/Sumana Balika Vidyalaya

නිපුණතාව : දෙවන වාරයට ආදාළ නිපුණතා සියල්ල ආවරණය වන පරිදි කාර්යය පත්‍රිකාවකට පිළිතුරු සපයයි.

නිපුණතා මට්ටම : නිපුණතා සියල්ල ආවරණය වන පරිදි ඉදිරිපත් කර ඇති කාර්යය පත්‍රිකාව අධ්‍යයනය කරමින් පිළිතුරු ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම් : කාර්යය පත්‍රිකාවට අදාළ ව අසන ලද ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු ලියමු.

- **<u>නිවැරදි පිළිතුරු තෝරන්න.</u>**

1. සුරපති වන්නමේ වන්නම නර්තනය කරනුයේ ,
   (i). මාත්‍රා 3 + 4 දෙතිතට ය. (ii). මාත්‍රා 4 තනි තිතට ය.
   (iii). මාත්‍රා 2 + 3 දෙතිතට ය. (iv). මාත්‍රා 3 තනි තිතට ය.

2. රන්විල රිද්දි විල විල කෙළිනා බිසවුනට - මැණික් විලේ දිය නාලා ගොඩ වෙන්ට....., කවිය
   (i). දහ අට සන්නියේ පාලි නැටුම්වල එන කවියකි (ii). රට යකුමේ දරු නැළවිල්ලේ එන කවියකි..
   (iii). කිරි මඩුවේ කිරි ඉතිරවීමේ කවියකි. (iv). රට යකුමේ නාන මුරයේ එන කවියකි.

3. ලංකාවේ බිහි වූ ප්‍රථම අංග සම්පූර්ණ ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව වන්නේ.
   (i). නෙළුම් පොකුණ රඟහළ (ii). මරදාන ටවර් රඟහළ
   (iii). ජෝන් ද සිල්වා රඟහළ (iv). එළි සබිතන් රඟහළ

4. පහන් පැළක් නිර්මාණය කිරීමේ දී මූලික වශයෙන් යොදා ගන්නා අමුද්‍රව්‍ය වන්නේ ,
   (i). අඩි 8ක් පමණ උස ඉනි තුනක්, හබරල අතු හා ගොරකා අතු
   (ii). අඩි 10ක් පමණ උස ඉනි හතරක්, හබරල අතු හා ගොක්කොළ
   (iii). අඩි 8ක් පමණ උස ඉනි තුනක්, ගොප් අතු හා ගොක්කොළ අතු
   (iv). අඩි 5ක් පමණ උස ඉනි දෙකක්, ගොප් අතු හා ගොරකා අතු

5. එක් ස්විචයක් මගින් ආලෝක පහන් වැඩි ප්‍රමාණයක් එකවර පාලනය කර ගත හැකි උපකරණයකි,

   (i). Dimmer (ii). Batten light (iii).Colour Scroller (iv). Colour wheel

- **<u>හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .</u>**

6. ගම්පළ යුගයේ නර්තන කලාව පිළිබඳ තොරතුරු අනාවරණය කර ගත හැකි පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස

   ........................................................................ වැදගත් වේ.

7. '' විදේශියන් දුටු පුරාණ ලංකාව '' මහනුවර යුගයේ ලංකාවට පැමිණි ......................................................ගේ කෘතියකි.

8. ..............................................................වර්ෂයේ දී ජාතික තරුණ සේවා සභා නර්තන කණ්ඩායම ආරම්භවීම සිදු විය.

9. ගොග් ගොග් ජිං ජිං ගත වට්ටම නර්තනය කරනුයේ ..........................................................................තිතට ය.

10. බැලේ නර්තන ශිල්පිනියක් අඳිනු ලබන රැළි සහිත කොට ගවුම ......................................................................නමින් ද

    එය නිර්මාණය වීමට පෙර භාවිතා කරන ලද ගවුම.......................................................................... නමින් ද හඳුන්වයි.

- **<u>සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.</u>**

11. C.M.Y යන කෙටි නාමය කෙටියෙන් හඳුන්වන්න.
12. අධ්‍යාපනික වශයෙන් දේශිය නර්තන කලාවේ සිදු වූ නව ප්‍රවණතා හතරක් ලියන්න.
13. බැලේ රංග කලාවේ ආරම්භය හා විකාශය සිදු වී ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
14. විවිධ ප්‍රසංගයක් සාර්ථකව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු ඇතුළත් සැළසුමක් සකස් කරන්න.